**දිඹුලාගල ප්‍රාදේශීය සභාව - 2020**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------------**

දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දිඹුලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) උතුරු මැද පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) ඇ (iii) උප වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරණ විගණන පනතේ 06 (i) ඈ (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විිසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහියංගනය උසාවියෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු 49,000.ක උසාවි දඩ ආදායම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් එම වටිනාකමින් දඩ මුදල අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | ඉදිරි වර්ෂයේ ඇස්තමේන්තුගත කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සභාවට අයත් රු.1,289,135 ක වටිනාකමක් සහිත අරලගංවිල සතිපොලහි මාළු වෙළඳ සැලෙහි වටිනාකම වත්කමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් එම වටිනාකමින් සභාවේ වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම් ලේඛනයේ සටහන් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. | වත්කමක් ලෙස නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | අරලගංවිල මාළු කඩ කාමර අංක 01 සහ 02 ට අදාල වාර්ෂික කුලී ආදායම රු.127,308 ක වුවත්, එය රු.15,000 ක් ලෙස ගිණුම් තැබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම සහ ලැබිය යුතු කඩ කුලී ආදායම රු.112,308 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ලේඛනගත කිරීමේදී සිදුවූ දෝෂයක් වන අතර, නිවැරදි කිරීමට කටයුතු සිදුකරන ලදී. | වත්කම් යටතේ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | ඇල්ලවැව සතිපොළට අදාලව සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟ සතිපොළ ආදායම රු.145,000 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.390,000 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයට අදාල සතිපොළ ආදායම සහ ලැබිය යුතු පොළ ආදායම රු.245,000 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2019 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.103,940 ක් වටිනා ස්ථාවර වත්කම් එම වර්ෂයේ පුනරාවර්තන වියදමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් ස්ථාවර වත්කම් අගය අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු සිදුකරන ලදී. | වත්කම් ලෙස නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.469,132 ක ස්ථාවර වත්කම් අයිතම් 10 ක් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් තැබීම නිසා ස්ථාවර වත්කම් වටිනාකම අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු සිදුකරන ලදී. | වත්කම් ලෙස නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 09 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම රු.42,499,223 ක වෙනසක් විය. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | නිවැරදි වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයභාරය ඉක්ම වූ වියදම රු.20,167,989 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.903,111 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා ගෙවිය යුතු ආයතන 86 ක් මඟින් රු.178,225 ක් 2020 දෙසැම්බර් 31 වන විට අයකර ඇති අතර, තවත් රු.71,745 ක ආදායමක් හිඟව පැවතුණි. | ආදායම් පරිපාලක දැනුවත් කර ඔවුන්ගේ නිර්දේශ අනුව කටයුතු කරමි. | ප්‍රචාරණ දැන්වීම් ගාස්තු අයවිය යුතු සියලු ආයතන වලින් ආදායම් අයකළ යුතුවේ. |